සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

II කොටස

**උපදෙස්:**

* **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) අභිඥානශාකුන්තලය අයත් වන්නේ කවර රූපක ප්‍රභේදයට ද? (ලකුණු 03 යි.)

(ii) ඉහත (i) හි දැක්වූ ප්‍රභේදයේ විශේෂ ලක්ෂණ **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත (ii) හි දැක්වූ ලක්ෂණවලින් අභිඥානශාකුන්තලය සමන්විත ද යි සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

**2.** (i) සංස්කෘත නාට්‍ය සඳහා භාවිත වන රංගභූමි වර්ග හා ඒවායේ ප්‍රමාණ නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත (i) හි ඔබ නම් කළ රංගභූමි වර්ග අතුරෙන් එකක හැඩය, ප්‍රමාණය, කොටස් හා ඒවායේ නාම රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) සංස්කෘත නාට්‍යයේ රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) කුවේණි නාට්‍යයේ "අන්ධකාරෙන් දහස් වසරෙක . . . ." ගීතය සම්පූර්ණ කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉහත (i) හි දැක්වූ ගීතයෙහි අන්තර්ගත පැදි පෙළේ අර්ථය විවරණය කරන්න. (ලකුණු 06 යි.)

(iii) කුවේණි නාට්‍යයේ පළමුවැනි අංකයේ, දඬයක්කරුගේ සම්ප්‍රාප්තිය දක්වා නාට්‍යමය වාතාවරණය ගොඩනැගෙන ආකාරය ආනුෂංගික අංග කෙරෙහි ද අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

## B කොටස

**4.** (i) කබුකි නාට්‍ය සම්ප්‍රදාය විකාසනය වූ අයුරු දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) කබුකි වේදිකාව, එහි කොටස් හඳුන්වාදෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) කබුකි නාට්‍යයේ අංග රචනා ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) 1980 සිට 2000 දක්වා සිංහල වේදිකාවේ කැපී පෙනුණු නාට්‍ය අධ්‍යක්ෂවරුන් **දෙදෙනකු** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04 යි.)

(ii) ඔබ ඉහත (i) හි සඳහන් කළ අධ්‍යක්ෂවරුන්ගෙන් **එක්** අයකු ගේ නිර්මාණ **දෙකක්** ගැන විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) 2000 වසරෙන් පසු ලංකාවේ සිංහල වේදිකා නාට්‍ය කලාවේ ප්‍රවණතා පිළිබඳ සාකච්ඡාවක් කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය ප්‍රචලිත ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්ප්‍රදායේ ආරම්භය හා විකාසය විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) ලංකාවේ පාස්කු නාට්‍යයක රඟ දක්වනු ලබන ප්‍රධාන අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

* * *